# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2025 මැයි මස 16 වන දින

## II වන කොටස

## අතිරේකය

(2025.05.20 දින නිකුත් කරන ලදී)

# සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන)

**2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කම්කරු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව:රු. 150.00

*මෙම ගැසට් අතිරේකය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මෙම වගන්තිය මගින් 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2025 මාර්තු මස 31 වන දින සිට බලපවත්වන පරිදි අයවැය සහන දීමනාව ගෙවීම නැවැත්වීම ය.

## සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන)

එල්.ඩී.- ඕ 19/2025

### 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය*

**1.** (1) මේ පනත 2025 අංක    දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන 2025 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

*2016 අංක 4 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2**. 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "2015 මැයි මස 1 වන දින සිට බලපවත්වන පරිදි" යන වචන වෙනුවට "2015 මැයි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2025 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි (2) වන උපවගන්තියේ "2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන" යන වචන වෙනුවට "2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2025 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා" යන වචන ආදේශ කිරීමෙන්.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2- PL 15219 - 465(2025/05)